**IPRC/16/329**

# රජරට ශිෂ්ටාචාර අවධියේ වාණිජ හා ආගමික වශයෙන් පදවිය ප්‍රදේශයේ පැවති වැදගත්කම

සුධර්මා ප්‍රේමසිරි[1*]

ආර්යයන්ගේ පැමිණීමත් සමඟ ලංකාව තුළ ජනාවාසකරණයෙහි ආරම්භය සිදු වූ අතර ඔවුන් එදා පැවති ජල මූලාශ්‍රය පදනම් කර ගනිමින් ජනාවාස ගොඩනගා ගත් බව පෙනේ. එලෙස ඇරඹි ඔවුන්ගේ ජීවන රටාවන් ක්‍රම ක්‍රමයෙන් පුළුල් වූ අතර, වැව් අමුණු තැනීම ආදී කටයුතුවල නිරත වෙමින් වර්තමානයේ දක්නට ලැබෙන විසල් වාරි කර්මාන්ත මෙන් ම දාගැබ්, ගොඩනැගිලි ආදියෙහි ද ආරම්භකයෝ වූහ. අතීතයේ ඔවුන්ගේ විවිධ ක්‍රියාකාරකම් මත ගොඩනැගුණා වූ රජරට ශිෂ්ටාචාරය වූ කලී මෙතෙක් ලක්දිව ඉතා දීර්ඝ කාල වකවානුවකට උරුමකම් කී ඉතා සශ්‍රීක රාජධානියක් විය.

උතුරුමැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් පදවිය ප්‍රදේශය අතීතයේ සිට ජනාවාස පැවතියා යැයි සැලකිය හැකි වන්නා වූ ඓතිහාසික පුරවරයකි. දශක ගණනක බිහිසුණු යුද්ධය හේතුවෙන් වැළලී තිබුණ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් පදවිය ප්‍රදේශයේ වැව ආශ්‍රිත පුරා විද්‍යා නටබුන් මගින් වැදගත් තොරතුරු රාශියක් හෙළි කර ගත හැකි ය. රජරට ශිෂ්ටාචාර අවධියේ දී පදවිය කෘෂිකාර්මික වශයෙන් සමෘද්ධිමත් ප්‍රදේශයක් වූවා මෙන් ම ආගමික වශයෙන් හා වෙළඳාම අතින් ද ඉතා වැදගත් විය. ක්‍රි.පූ. ශත වර්ෂවලට අයත් ශිලාලිපි පදවිය හා අවට ප්‍රදේශවලින් හමු වී ඇත්තේ සුළු වශයෙනි. රජරට ශිෂ්ටාචාරයේ ආරම්භක අවධියේ දී මෙම ප්‍රදේශය ජනාකීර්ණ නොවී තිබීම මෙයට හේතු වන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත් කල් යාමේදී ප්‍රදේශය වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් වර්ධනය වී ඇති බව පෙනේ.

ක්‍රි.ව. 11 හා 12 වන ශත වර්ෂ පමණ වන විට පදවිය ආගමික වශයෙන් මෙන් ම ඉතා වැදගත් වෙළඳ නගරයක්ව පැවති බව මූලාශ්‍රය තොරතුරු අනුව උපකල්පනය කල හැකි ය. හමු වී ඇති දෙමළ ශිලා ලිපිවලට අනුව දකුණු ඉන්දියානු වෙළඳ ශ්‍රේණි වන සෙට්ඨි, නානාදේශී හා අයින්නූර්වාර් නම් වෙළඳ ශ්‍රේණි පිළිබඳව සඳහන් වේ. වෙළඳාමේදී භාණ්ඩ එකතු කරන ලද හා බෙදා හරින ලද මධ්‍යස්ථානයක් වශයෙන් පදවිය එකල ප්‍රසිද්ධ ව පවතින්නට ඇත. එසේ ම ආගමික වශයෙන් වැදගත් වන නටබුන් රාශියක් හමු වී තිබීම ද වැදගත් ය.

රජරට ශිෂ්ටාචාර අවධියේ දී ආගමික හා වාණිජ අංශයෙන් පදවිය ප්‍රදේශයේ පැවති වැදගත්කම පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණ වේ. එමෙන් ම ආගමික ක්ෂේත්‍රය එක් ආගමක් පමණක් කේන්ද්‍ර කර ගනිමින් පැවතුනාදැයි විමසා බැලීම, සෙසු අරමුණ අතර වේ. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැණුනි. පුරාවිද්‍යාත්මක හා ශිලාලිපි මගින් පදවිය ප්‍රදේශය 11 හා 12 වන ශත වර්ෂය පමණ වන විට ආගමික හා වාණිජ ක්ෂේත්‍රයන්හි මහත් වැදගත්කමකින් යුක්ත වූ බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *පදවිය, වාණිජ, ආගමික, රජරට ශිෂ්ටාචාරය, ශිලා ලේඛන.*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. *jspsudarma@gmail.com